කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)-2023

2026 - මාර්තු

**BCOM E 4015 - උපායමාර්ගික කළමනාකරණය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහයි : (05) කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක 01**

අ) ක්‍රමෝපායික කළමනාකරණය (Strategic Management) යනු කුමක්දැයි නිර්වචනය කර, දිනෙන් දින වෙනස්වන වෙළඳපොළ පරිසරයන් තුළ ක්‍රියාත්මක වන නවීන ව්‍යාපාර සංවිධාන සඳහා එය වැදගත් වන්නේ ඇයිද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ) PESTEL විශ්ලේෂණය භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ සිල්ලර සුපිරි වෙළඳසැල් ජාලයකට බලපෑම් කළ හැකි ප්‍රධාන බාහිර පරිසර බලවේග විශ්ලේෂණය කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

අ) ක්‍රමෝපායික සැලසුම්කරණයේදී භාවිතා වන දැක්ම (Vision), මෙහෙවර (Mission), සහ අරමුණු (Objectives) යන සංකල්ප අතර ඇති වෙනස්කම් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ) සංවිධාන බොහෝවිට මුලින් සැලසුම් කළ ක්‍රමෝපායන් සම්පූර්ණයෙන්ම ඒ ආකාරයෙන්ම අනුගමනය නොකරයි. අභිප්‍රේත ක්‍රමෝපායන් (Intented), සංවිධානාත්මකව ක්‍රියාත්මක කරන ක්‍රමෝපායන් (Deliberate), උද්භව වන ක්‍රමෝපායන් (Emergent), සහ අවසානයේ ප්‍රතිඵල ලෙස දෘශ්‍යමාන වන (Realized) ක්‍රමෝපායන් අතර ඇති සම්බන්ධතාවය සුදුසු රූප සටහනක් භාවිතා කරමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ) සම්පත් මූලික දෘෂ්ටිකෝණය (RBV) යන සංකල්පය පැහැදිලි කර, VRIO රාමුව (VRIO Framework) භාවිතා කරමින් එය තිරසාර තරඟකාරී වාසිය ලබා ගැනීමට දායක වන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 08)

ආ) ලෝක වෙළඳපොළ තුළ වැඩිවන තරඟයට මුහුණ දෙන ශ්‍රී ලංකා ඇඟලුම් නිෂ්පාදන සමාගමක් සඳහා උපදේශකයෙකු ලෙස ඔබ පත් කර ඇති බව උපකල්පනය කරන්න. එම සමාගම සඳහා ශදුඅත විශ්ලේෂණයක් (SWOT Analysis) සංවර්ධනය කර, එම විශ්ලේෂණය භාවිතා කර සංවිධානයට තම ක්‍රමෝපායික ස්ථානය වැඩිදියුණු කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

අ) ව්‍යාපාර මට්ටමේ ක්‍රමෝපාය (Business Level Strategy) යන සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) පෝටර්ගේ සාමාන්‍ය තරඟකාරී උපායමාර්ග (Generic Competitive Strategies) භාවිතා කරමින් සමාගම් කර්මාන්තයක තුළ සාර්ථක ලෙස තරඟ කරන්නේ කෙසේද යන්න සාකච්ඡා කරන්න. සුදුසු යථාර්ථ උදාහරණ ලබා දෙන්න.

(ලකුණු 15)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

පහත සංකල්ප පිළිබඳ කෙටි සටහන් ලියන්න.

අ) ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම (Strategy Implementation)

ආ) ආපසු හැරීමේ ක්‍රමෝපායන් (Retrenchment Strategies)

ඇ) සමබර ලකුණු පත්‍රය (Balanced Scorecard)

ඈ) සැසඳීමේ උපායමාර්ග (Benchmarking)

(ලකුණු 5 × 4)

**(මුළු ලකුණු 20)**